# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක 8,586—1940ක්වූ මාර්තු මස 8 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාංග නීති.

වන්දනා ගමන් පිළිබඳ ආඥාපනත.

සන්තාන මංගල්‍යය සම්බන්ධ ව්‍යවස්ථා.

(133වෙනි පරිච්ඡේදය වන) වන්දනා ගමන් පිළිබඳ ආඥාපනතෙහි 2වෙනි වගන්තියෙන් ලත් බලය ප්‍රකාර ලංකාණ්ඩුකාරතුමා වන ඇන්ඩෘ කැල්ඩිකොට් නමැති මම 1940 මාර්තු මස තලවිල පවත්වනුලබන සන්තාන මංගල්‍යයට සිරිත් පරිදී කෙරෙන වන්දනා ගමන උදෙසා මෙම දැන්වීමෙන් පහත සඳහන් ව්‍යවස්ථා පනවමි.

ඒ කැල්ඩිකොට්,
ලංකාණ්ඩුකාරතුමා.

1940 පෙබරවාරි මස 29වෙනි දින
කොළඹදීය.

ව්‍යවස්ථා.

**1.** මෙම ව්‍යවස්ථාවල "ලැගුම්භූමි" යන්නෙන් හඟවන්නේ මිට යාකර තිබෙන උප ලේඛනයෙහි සඳහන්වන සීමාතුළ පිහිටි භූමිභාගයයි "උප දිසාපතිතුමා" යන්නෙන් හඟවන්නේ පුත්තලම හලාවත දෙපළාතේ උප දිසාපතිතුමාය.

**2.** උප දිසාපතිතුමාගේ විශේෂ හෝ සාමාන්‍ය අණවකින් ලැගුම්භූමිය තුළ ලැගුම්ගැනීම තහනම්කරනලද කිසිම ස්ථානයක කිසිවකු විසින් ලැගුම් ගතයුතු නොවේ.

**3.** ශරීරකෘත්‍ය සඳහා උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව වෙන්කර තිබෙන ස්ථානවල හැර ලැගුම්භූමිය තුළ අන්කිසි තැනක කිසිවකු විසින් මලමූත්‍ර නොකළ යුතුයි.

**4.** උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා වෙන්කර තිබෙන ස්ථානවල හෝ භාජනවල මිස ලැගුම්භූමියේ වෙන තැනක කිසිවකු විසින් කුණුකසළ රොඩු ආදිය හෝ කුණුවතුර නොදැමිය යුතුයි.

**5.** (*a*) මැරීම පිණිස ලැගුම්භූමියට ගෙනෙනලද ගවයන් හා උප දිසාපතිතුමාගේ විශේෂ හෝ සාමාන්‍ය අණවකින් එබඳු භූමියෙහි තබාගැනීමට අවසර දෙනලද ගවයන් හැර අන්කිසි ගවයකු ලැගුම්භූමියෙහි තබානොගත යුතුයි.

(*b*) උප දිසාපතිතුමා විසින් ගවගාලක් වශයෙන් විශේෂයෙන් නියමකරනලද තැනක හෝ ඒ කටයුත්තට යෙදීම පිණිස ඔහු විසින් අනුමතකරනලද තැනක හැර ලැගුම්භූමියට සමීපව වෙන තැනක ගවයින් නොතැබිය යුතුයි.

(*c*) ගවයින් භාරව සිටින අය උන්ගේ ගොම ඊට නියමකර තිබෙන අසල ස්ථානයකට ඉවත්කරවා තමාගේ ගවයන් ඉන්නාතැන සෑමවිටම පවිත්‍රකර තබාගත යුතුයි.

**6.** ආහාර පිණිස සාදා ලැගුම්භූමිය තුළ විකුණනුලබන සියලුම කෑම ජාති (*a*) පිරිසිදු කඩදාසිවල නොහොත් රෙදිවල දවටා හෝ ඉන් වසා හෝ, (*b*) වසනලද වීදුරු පෙට්ටිවල දමා හෝ (*c*) ලැගුම්භූමිය භාර සනීපාරක්ෂක නිලධාරීතුමා විසින් හෝ වෛද්‍ය නිලධාරීතුමා විසින් මැනවයි පිළිගන්නාලද වෙනත් පියන් සහිත භාජනවල දමා හෝ මැස්සන්ගෙන් හා දූවිල්ලෙන් ආරක්ෂාකළ යුතුයි.

**7.** බෝවෙන රෝගයකින් පෙළෙන කෙනකුට හෝ ලැගුම්භූමියේ පවිත්‍රකමට බාධාවක්ව සිටියහැකි කෙනකුට ලැගුම්භූමියට ඇතුල්වන්නට ඉඩනොදිය යුතුයි.

**8.** මංගල්‍යය කාලය තුළදී ලැගුම්භූමියෙහි යම් වසංගත රෝගයක් හටගැණුනිනම් වන්දනාකාරයින්ට වන්දනා භූමියෙන් පිටවී යන්නටද, පිටවී යන මාර්ග සහ ඔවුන් ගෙනයන ක්‍රම නියමකරන්නටද උප දිසාපතිතුමාට පුළුවන.

**9.** (*a*) ලැගුම්භූමිය තුළ බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන සෑම අයද, (*b*) ඔහු එසේ පෙළෙන බව දැනදැනම ඔහු සමග වාසයකරන සෑම අයද ඒ රෝගියා ගැන ලැගුම්භූමිය භාරව සිටින සනීපාරක්ෂක නිලධාරීතුමාට හෝ වෛද්‍ය නිලධාරීතුමාට දැනුම්දෙන්නට ඕනෑය.

**10.** ලැගුම්භූමිය තුළ යම් වැවක් හෝ ළිඳක් යම් නියම කටයුත්තක් සඳහා වෙන්කොට ඒ බවට ඒ ස්ථානයෙහි දැන්වීමක් ගසා තිබෙනවිට එම වැව හෝ ළිඳ එය වෙන්කොට තබා තිබෙන කටයුත්ත සඳහා හැර අන්කිසි දෙයකට කිසිවකු විසින් නොයෙදිය යුතුයි.

**11.** පාන්ගෙයක්, සිසිල්බීම සාදන ස්ථානයක්, තේ සහ කෝපි කඩයක්, භෝජනශාලාවක් හෝ ශාලක් තැබීම පිණිස උප දිසාපතිතුමාගෙන් කලින් බලපත්‍රයක් ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ එබඳු ස්ථානයක් තබාගතයුතු නොවේ. බලපත්‍රය නොමිළයේ දෙනුලැබේ.

12. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමියේ මහ වීදියෙන් හෝ වෙනයම් වීදියකින් අහුවනසේ යම් කඩයක් තැනීම හෝ වෙනයම් ගොඩනැගිල්ලක් දික්කිරීම යුතුනොවේ.

13. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ හෝ එහි මායිම්වල සිට හැනැප්මක් ඇතුළත හෝ ගිනිකෙළි හෝ තුවක්කු පත්තු නොකළ යුතුයි.

14. උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා නියමකර තිබෙන ස්ථානයක හැර ලැගුම් භූමිය තුළ කිසිවකු විසින් සතුන් නොමැරිය යුතුයි. තවද එබඳු ස්ථානයෙහි සතුන් මරන සෑම අයම එය පවිත්‍රව තබාගැනීම ගැන වගකිය යුතුවේ.

උප ලේඛනය.

තලවිල ලැගුම්භූමියේ සීමා.

උතුරට තලවිලඕඩෙයි; දකුණට ඒතාලේ තලවිල සහ තේලා කුඩාතලවිල පාරවල්වල එරුඹුකුඩල් හන්දියේ සිට කෙළින් බස්නාහිර අතට මුහුදට යන පාර; නැගෙනහිරට පාණ්ඩාරම් කරුක්කුවච්චම් පෙරියපොත්ථිවාඩි පාරවල්; බස්නාහිරට මුහුද.

ඒතාලේ ලැගුම්භූමියේ සීමා.

උතුරට තෙලිකුඩාවේ සිට වැලිකන්ද දක්වා බස්නාහිරට යන පාර; නැගෙනහිරට කලපුව; දකුනට සුරුම්අැල; බස්නාහිරට වැලිකන්ද.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Nuwara Eliya No. 94.**—මධ්‍යම දිසාවේ නුවරඑළියේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ අප්‍රේල් මස 27වෙනි දිනවූ සෙනසුරාදා උදේ 10ට නුවරඑළියේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරන්දෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ වලපනේ කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

සිතියමේ නො. B. S. P. P. 250. ගම—හරස්බැද්ද.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | | | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 18 | අලපලාවෙපතන, මහපතන | — | .. ආණ්ඩුව | .. පතන | .. 0 | 3 | 1 | 260* |

* ප්‍රසිද්ධ වෙන්දේසියට.

මෙම ඉඩම සම්බන්ධ වැඩිදුර තොරතුරු නුවරඑළියේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒගේ සිතියම සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1940ක්වූ මාර්තු මස 2වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට එනම් :—හල්මහුර-කුකුල්කෝරළේ ගම්සභාපාර සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන ප්‍රොගෝර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර බලය ලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

වෝකෙපො මුල් සිතියමේ නො. 3වෙනි 1වෙනි කොටස. ගම—කදල්මැල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 614 | හිගුරුබබවැටිය | .. හේන | .. සුදුහකුරුගේ පොඩියා, කදල්මැල්ල | .. 0 | 0 | 3·6 |
| 615 | — | .. ගම්සභාපාර | .. එම .. | .. 0 | 0 | 15·3 |
| 616 | හිගුරුබබවැටිය | .. හේන | .. එම .. | .. 0 | 0 | 1·3 |
| 617 | එම | .. එම | .. එම .. | .. 0 | 0 | 5·9 |
| 618 | එම | .. එම, අවුරුද්දක් වයස ඇති කොස්ගහක් තිබේ | එම .. | .. 0 | 0 | 1·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ අප්‍රේල් මස 2වෙනි දින පෙරවරු 10ගේ කාහිසම්ව ඉංගිරියේ ගම්සභා උසාවියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑම් සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිති කමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1940ක්වූ මාර්තු මස 5වෙනි දින කළුතර කච්චේරියේදීය.

එච්. ඒ. තෙන්නකෝන්,
කළුතර ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වෙනුවට.

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පාඨශාලා ගොඩනැගිලි සෑදීම.

පහත සඳහන් ස්ථානවල පාඨශාලා ගොඩනැගිලි, ගුරු නිවාස, වැසිකිළි, ළිං යන මේවා සෑදීම සඳහා ටෙන්ඩර්පත්‍ර මාර්තු 25වෙනි දින දවල් 12 වනතුරු වයඹ කොට්ඨාසය බාර ප්‍රධාන පරීක්ෂකතුමා විසින් බාරගනු ලැබේ :—

P/වල්පාලුව, A/තුරුවිල, A/කපුගොල්ලෑව, A/දෙමුන්නෑව, A/කඹාල, Ku/කුලෝගෙදර, Ku/දෙමටගොල්ල, Ku/ඔමුණකොටුව (ගුරුනිවාසයට කාල්ලක් ගැනීම), Ch/කටුකැන්ද (ගුරුනිවාසය), A/කිරිදිවත්ත, A/කඩවත්ගම, A/කුඹුක්වැව, A/මහදිවුල්වැව, A/පල්ලියගොඩැල්ල, Ch/ලුණුවිල, Ch/මාදම්පෙ, Ku/කිවුල්ගල්ල, Ku/කුඹුක්ගැටේ, Ku/කොස්වත්ත, P/මුණමල්ගස්වැව.

ප්ලෑන්, වැඩ පිළිවෙළ සහ වෙන විස්තර කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයාධිපති වයඹ කොට්ඨාසයේ ප්‍රධාන පරීක්ෂකතුමාගෙන් දැනගත හැකිය.

සංලක්ෂ්‍යය.—"P" යන්නෙන් පුත්තලම දිස්ත්‍රික්කයද, "A" යන්නෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයද, "Ku" යන්නෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයද, "Ch" යන්නෙන් හලාවත දිස්ත්‍රික්කයද ප්‍රකාශ වේ.

1940 මාර්තු 9වෙනි දින කොළඹ අධ්‍යාපන කාර්යාලයේදීය.

මිට, ඇල්. මැක්ඩී. රොබිසන්,
අධ්‍යාපනාධ්‍යක්ෂතැන.

## අන්‍ය දැන්වීමයි.

කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑකෝරළයේ වනවහල පදිංචි දූඩිගමගේදවගේ එමලින් වන්‍රාවතී වන මම, වර්ෂ 1907 අංක 1 දරණ ආඥාපනතේ 1B දරණ උප ලේඛණයේ 2වන වගන්තිය අනුව, මෙතැන් පටන් තුන්මසක ඇවෑමෙන්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හැටියට සිංහල භාෂාවෙන් කටයුතු කිරීම පිණිස ඇතුළත්කර ගැනීමට රිජිස්ට්‍රාර් ජනරාල්තුමන් වෙතින් ඉල්ලුම්කරණ බැව් මෙයින් දැනුම්දී සිටිමි.

1940 පෙබරවාරි මස 23වෙනි දින දීය.

ඩී. එමලින් වන්‍රාවතී.